VERITÉ RESEARCH

NO. 5 POLICE PARK PLACE, COLOMBO 00500, SRI LANKA

TEL: + 94 718 834945; FAX: +94 719379567

EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# රැකියා උත්පාදනයක් නොමැති ආර්ථික වෘද්ධියක්

2013 දී ශ්‍රී ලංකා ආර්ථිකය 6.4% වේගයකින් වර්ධනය විය. මෙය අපේක්ෂිත ආර්ථික වර්ධන වේගයට වඩා අඩු වුවත් සැළකිය යුතු මට්ටමේ වර්ධන වේගයකි. 2010 සහ 2011 යන වර්ෂයන් වලදී ආර්ථික වර්ධනය 8% ක් වැනි ඉහළ අගයකට වර්ධනය විය. එනමුදු මෙහිදී පැන නගින ගැටළුව නම් මෙම ආර්ථික වර්ධනය රැකියා ජනනය සඳහා දායකත්වය ලබාදී නොතිබීමයි.

විශේෂයෙන්ම වර්ෂ 2005 සිට ආර්ථික දත්ත විශ්ලේෂණයේදී පෙනී යන්නේ ආර්ථික වර්ධනයට සාපේක්ෂව රැකියා වර්ධනය ඉතා මන්දගාමී හා ඇතැම් අංශතුල ප්‍රතිවිරෝධී මුහුණුවරක් ගෙන ඇති බවයි. රැකියා ජනනයකින් තොරවූ ආර්ථික වෘද්ධිය මවිතයට තුඩු දෙන ගැටළුකාරී කරුණක් බැවින්ම එය පිළිබඳව ගැඹුරින් විමසා බැලීම කාලෝචිත වේ.

## ඔබට සැබෑ තතු හෙළි කරගත හැක්කේ සේවා වියුක්ති අනුපාතිකය දෙස නොව ආර්ථිකයේ සැබෑ රැකියා මට්ටම දෙස බැලීමෙනි

රැකියා නියුක්තිය සම්බන්ධව භාවිතා වන වඩාත් ප්‍රචලිත මිනුම් දණ්ඩ වන්නේ සේවා නියුක්ති හා සේවා වියුක්ති අනුපාතිකයන්ය. පසුගිය දශකය පුරාවටම සේවා වියුක්ති අනුපාතිකය අඩු වෙමින් පවතින ප්‍රවණතාවයක් ගත් අතර 2012 දී එය 4% වැනි ඉතා අඩු අගයක් ගන්නා ලදී. මින් ගම්‍ය වන අර්ථය නම් ශ්‍රම බලකායෙන් 96% ක් පමණ රැකියා නියුක්ති බවයි. තර්කානුකූලව බැලීමේදී රැකියා අවස්ථාවන් අඩුවන ප්‍රවණතාවයක් සහ අඩු සේවා වියුක්ති අනුපාතිකයක් පැවතිය හැක. මීට බලපාන ප්‍රධාන සාධකය වන්නේ ශ්‍රම බලකාය අර්ථකථනය කර ඇති ආකාරයයි. එනම් "වයස අවුරුදු 10 වඩා වැඩි සේවා නියුක්ත හා සේවා වියුක්ත ජන කොටස" යනුවෙනි. සේවා වියුක්ත යනු ශ්‍රම බලකායට අයත් වර්තමානයේ රැකියාවක් නොකරන නමුත් රැකියා අපේක්ෂිත ජන කොටසයි. මෙම නිර්ණායකයට අනුව යම් කිසි පුද්ගලයෙකු රැකියා සෙවීම නතර කළහොත් ඔහු හෝ ඇය තවදුරටත් ශ්‍රම බලකායට අයත් නොවන අතර ඊට සාපේක්ෂව රැකියා වියුක්ති මට්ටමත් අඩු වීමකට භාජනය වේ.

සාමාන්‍යයෙන් ආර්ථිකයක් වර්ධනය වීමේදී ඊට අනුරූපීව රැකියා සහ ආදායම් ඉපයීමේ අවස්ථාවන් මෙන්ම අපේක්ෂාවන් ද වර්ධනය වේ. එනමුත් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ මෙහි ප්‍රතිවිරුද්ධ තත්වය එනම් ආර්ථික වර්ධනයට සාපේක්ෂව රැකියා වර්ධනය ප්‍රතිවිරෝධී තත්වයක් පෙන්නුම්කොට ඇත. 2011 දී ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය මිලියන 8.55 ක පමණ අගයක් ගත් අතර 2012 දී මෙය මිලියන 8.46 ක් දක්වා අඩු විය. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත දත්ත විශ්ලේෂණයේදී පෙන්වන්නේ 2011- 2012 කාල පරාසය තුළ ශ්‍රී ලංකා ආර්ථිකය තුළ 90,000 පමණ සංඛ්‍යාවකින් ශ්‍රම බලකාය අඩු වීමකට භාජනය වී ඇති බවයි. ප්‍රජා විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් බැලීමේදී ශ්‍රී ලංකාව ජනගහනය වයස්ගත වීම සම්බන්ධව සංක්‍රාන්ති සමයක පසුවන මුත් ශ්‍රම බලකායෙන් නික්ම යන ප්‍රමාණය වාර්ෂිකව ඊට ඇතුළත් වන ප්‍රමාණයට වඩා තවමත් අඩු අගයක් ගනී. මෙවැනි සන්දර්භයක් තුළ ශ්‍රම බලකාය 90,000 ක පමණ ප්‍රමාණයකින් වර්ෂයක කාලයක් තුළ අඩු වීමකට ලක්වීම මෙම ගැටළුව වඩාත් ත්‍රීව්‍ර කරයි. පශ්චාත් යුධ සමයේ ශ්‍රී ලාංකික ආර්ථිකය තුළ සිදුවූ සීඝ්‍ර වර්ධනයට ප්‍රතිවිරුද්ධ ලෙස 2011-2012 කාල පරාසය තුළ සේවා නියුක්ති සංඛ්‍යාව 68,222 ක අඩුවීමක් පෙන්නුම් කොට ඇත.

ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ ආංශික සංයුතියන් දෙස විමර්ශනාත්මකව බැලීමේදී මෙම ගැටළුවේ තීව්‍රතාවය මනා ලෙස පැහැදිලි වන මුත් ඊට බලපාන හේතු හඳුනාගැනීම අසීරු කරුණකි. පහත දැක්වෙන අංක 1 සහ අංක 2 යන රූප සටහන් මගින් 2011 - 2012 කාල පරාසය තුළ කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශයන්හි සේවා නියුක්තියෙහි වෙනස දක්වා ඇත.

රූප සටහන 01: දළ දේශීය නිෂ්පාදිතයේ සහ සේවා නියුක්තියේ ආංශික වර්ධනය

| | | | | |
|---|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික වර්ධනය | 5.8% | 10.3% | 4.6% | 6.4% |
| 2012 | කෘෂිකාර්මික අංශය | කාර්මික අංශය | සේවා අංශය | දළ දේශීය නිෂ්පාදිතය |
| සේවා නියුක්තියේ වර්ධනය | -7.5% | 7.2% | -0.6% | -0.8% |

මින් පැහැදිලි ලෙස පෙනී යන්නේ 2011-2012 කාලය තුළ කෘෂිකාර්මික හා සේවා අංශවල සේවා නියුක්තියෙහි විශාල බිඳවැටීමක් තිබෙන බවත් කාර්මික අංශය පමණක් සේවා නියුක්තියට ධනාත්මක දායකත්වයක් ලබාදී ඇති බවයි. 2011-2012 කාලය තුළ කෘෂිකාර්මික අංශය දළ දේශීය නිෂ්පාදිතය තුළ 5.8% ක ආංශික වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එනමුත් මවිතයට තුඩු දෙන කරුණ නම් මෙම අංශය තුළ පමණක් අදාල කාල වකවානුවේ දී  සේවා නියුක්තිය 188,749 කින් (රූප සටහන 1) නැතහොත් 7.5% කින් (රූප සටහන 2) අඩු වීමයි. එපමණක් නොව කෘෂිකාර්මික හා මත්ස්‍යය කර්මාන්තයෙහි නියුතු නිපුණතාවයන් සහිත සේවා නියුක්තිකයන් සංඛ්‍යාව 2011 - 2012 කාලය තුළ 144,000 කින් පමණ අඩුවී තිබේ.


2012 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් ආකාරයට “වෙළඳ හා හෝටල්ත ප්‍රවාහන ගබඩා සහ සන්නිවේදන උපඅංශයන් සේවා අංශයෙහි රැකියා අවස්ථාවන් උත්පාදනය සඳහා ධනාත්මකව දායක විය” (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2012, පිටු අංක 114). මෙය සේවා වියුක්තියේ සැබෑ ස්වරූපය විකෘති කොට දක්වන ප්‍රකාශයක් වන්නේ වෙළඳ හා හෝටල් යන අංශයන් ඒකරාශී කොට වඩාත් පොදු කුලකයකට අන්තර්ගත කොට තිබෙන නිසාවෙනි. 2011-2012 කාල පරාසය තුළ හෝටල් සහ ආපනශාලා අංශයෙහි සේවා නියුක්තියේ 7.9% ක පසුබෑමක් ඇති විය. නමුත් විමතියට කරුණ නම් එම කාල රාමුව තුළ හෝටල් සහ ආපනශාලා අංශයේ දළ දේශීය නිෂ්පාදිතය තුළ ආංශික වර්ධනය 21% වැනි ඉහළ අගයක් ගැනීමයි. එමෙන්ම 2012 වර්ෂය ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තයේ සුවිශේෂී කඩඉමක් වූ මිලියනයකට අධික සංචාරක පැමිණීමක් හා ඇමරිකානු ඩොලර් රුපියල් බිලියනයක් ඉක්මවූ ආදායම් ලැබූ සුවිශේෂී වර්ෂය වීමයි.

## 'යුද්ධය පැවති කලාපයට සාපේක්ෂව සෙසු ප්‍රදේශවල සේවා නියුක්තිය

සේවා නියුක්තිය හා සම්බන්ධ ප්‍රාදේශීය දත්ත පිරික්සා බැලීමේදී එය ප්‍රධාන කොටස් 3 කට බෙදා වෙන් කොට දැක්විය හැකිය. එනම් උතුරු පළාත, නැගෙනහිර පළාත හා සෙසු සියළුම පළාත් යනුවෙනි. පශ්චාත් යුධ සමයේදී උතුරු හා නැගෙනහිර පළාත් තුළ සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ඇති වූ මුත් 2011-2012 කාලය තුළ මෙම පළාත් දෙකෙහිම සේවා නියුක්තියේ වර්ධනයක් සිදුවී තිබෙන්නේ කර්මාන්ත අංශයේ පමණි. එනම් උතුරු පළාතෙහි 13,000 ක් සහ දකුණු පළාතෙහි 17,000 වශයෙනි. උතුරු පළාතෙහි කෘෂිකාර්මික හා සේවා අංශයන්හි සේවා නියුක්තිය පිළිවෙලින් 4,590 කින් සහ 15,702 කින් අඩුවීමකට භාජනය වී ඇත. නැගෙනහිර පළාතෙහි කෘෂිකාර්මික සේවා නියුක්තිය 7,370 කින් වර්ධනය වූ නමුත් සේවා

අංශයේ සේවා නියුක්තිය 21,693 කින් පමණ අඩුවී ඇත. මෙම පළාත් දෙකෙහි ආංශික සේවා නියුක්තියෙහි වර්ධනය සෙසු සියලු පළාත් හි වර්ධනයට සාපේක්ෂව ඉහළ වන අතර අඩු වීමද සෙසු සියළු පළාත් වලට වඩා අඩු අගයක් ගනී. මින් ගම්‍ය වන අර්ථය නම් උතුරු හා නැගෙනහිර පළාත් වලට සාපේක්ෂව දිවයිනේ සෙසු සියලු පළාත්වල සේවා නියුක්තියෙහි වන වෙනස්වීම් වඩාත් තීව්‍ර බවයි. එමෙන්ම විශේෂ අවධානයට ලක්විය යුතු කරුණ වන්නේ මෙම කුමන තත්වයක් යටතේ වුවද සේවා නියුක්තියෙහි වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පැවතීමයි.

රූප සටහන 2 : සේවා නියුක්තියෙහි ආංශික හා ප්‍රාදේශීය වෙනස 2011 - 2012



## රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි සීඝ්‍ර වර්ධනයක්

සමස්ථ ආර්ථිකය තුළ රැකියා අවස්ථාවන් අඩු වෙමින් පවතින වාතාවරණයක් හමුවේ වුවද රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය වර්ධනීය ප්‍රවනතාවයක් පෙන්නුම් කොට ඇත. 2011-2012 කාල පරාසය තුළ පමණක් රාජ්‍ය අශයේ සේවා නියුක්තිය 50,000 කින් පමණ ඉහළ ගොසු ඇත. රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි මෙම ඉහළ යාමට ප්‍රධාන දායකත්වය සැපයුවේ නැගෙනහිර පළාත හැර දිවයිනේ සෙසු ප්‍රදේශ වලිනි. එනම් උතුරු පළාතෙහි පමණක් 11,000 ක වැඩිවීමක් සහ "උතුරු නැගෙනහිර පළාත් හැර සෙසු සියළු පළාත්" සමුහයේ 62,659 ක වැඩි වීමක් වශයෙනි. මෙම කාලය තුළ නැගෙනහිර පළාත තුළ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 23,877 කින් පහළ වැටී ඇත.

## ගැටළු සහගත තැන් කිහිපයක්

නිමවුමේ (දළ දේශීය නිෂ්පාදිතයෙහි) වර්ධනය සේවා නියුක්තියේ වර්ධනය අභිබවා යෑම ඵලදායිතා දෘෂ්ඨි කෝණයකින් බලන කල්හි ආර්ථිකයට ආශිර්වාදයකි. එනමුදු තවමත් සංවර්ධනය වෙමින් පවතින සාපේක්ෂව අඩු තාක්ෂණික භාවිතයක් සහිත ශ්‍රී ලංකාව බඳු ආර්ථිකයකට "රැකියා ජනනයකින් තොර ආර්ථික වෘද්ධිය" බලවත් ගැටළුවකි.

මේ ආකාරයට නිමවුමේ වර්ධනයට සාපේක්ෂව සේවා නියුක්ත අවස්ථාවන් ජනනය වීම සම්බන්ධයෙන් අසාමාන්‍ය පරස්පරතාවයක් ඇති වීමට බලපාන ප්‍රධාන හේතු මොනවාද? එය දළ දේශීය නිෂ්පාදිතය සහ සේවා නියුක්තිය ඇස්තමේන්තු කිරීමේ අඩුලුහු!ඩුතාවයක් එනම් නිමවුම වැඩිවීම හා සේවා නියුක්තියේ අඩුවීම අධිතක්සේරු කිරීමක් නිසා පැන නගින තත්වයක් විය හැකිද? කෙසේ නමුත් නිමවුම හා සේවා නියුක්තියේ වර්ධනයන් දීර්ඝකාලීනව විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ශ්‍රී ලංකා ආර්ථිකය තුළ මෙම රැකියා ජනනයෙන් වියුක්තව සිදුවන ආර්ථික වර්ධනය දිගු කාලයක් තිස්සේ පවතින ගැටළුවක් බවයි.

සමස්ථ ආර්ථිකය දෙස නෙත යොමු කරන කල්හි ගැටළුකාරී තත්වයක් ලෙස පිළිබිඹු වන මෙම දළ දේශීය නිෂ්පාදිතය හා රැකියා අතර පරස්පරතාවය ආංශික හා ප්‍රාදේශීය දෘෂ්ඨිකෝණයන්ගෙන් විශ්ලේෂණය කළ විට තවත් ගැඹුරු ඉසව්වකට අර්බුදයන් රැසකට අපව රැගෙන යයි.

**වෙරිටේ රිසර්ච් යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**